පාර්ලිමේන්තු වටරවුම අසල අප්‍රේල් 05, 2022 පැවති විරෝධතාව අතරට යුධ හමුදා යතුරුපැදි බලකා සෙබළ පිරිසක් පැමිණීම සහ ඊට පොලිස් නිලධාරීන් දැක්වූ ප්‍රතිචාරය සම්බන්ධයෙන් අප්‍රේල් 06, 2022 දින පුවත්පත් වාර්තා කර තිබිණි.

එහිදී සිදුවීම පිළිබඳව වගකීම පැවරිය යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් විවිධ කෝණයන් ඔස්සේ වාර්තා වී තිබුණේ මෙසේයි.

1) දිවයින සිරස්තලය: "විරෝධතාව ලඟට ආ හමුදා යතුරුපැදි කණ්ඩායමට පොලිසියෙන් දැඩි විරෝධය"

- විරෝධතාව අතරට යුද හමුදා යතුරුපැදි බළකා සෙබළ පිරිසක් පැමිණ ඇත.

- එහි ආරක්ෂාවේ නියුතු වූ පොලිස් නිලධාරීන්ගෙන් ඔවුනට දැඩි විරෝධයක් එල්ල වී ඇත.

2) අරුණ සිරස්තලය:"යුද හමුදා යතුරුපැදි කණ්ඩායමකට බාධා කළැයි ASP ලා ගැන විමර්ශන"

- යුද හමුදා විශේෂ බළකා යතුරුපැදි කණ්ඩායමක් පාර්ලිමේන්තුව අසල මාර්ග බාධකයක් අසලට පැමිණ ඇත.

- ඔවුන්ට නුසුදුසු ආකාරයෙන් කටයුතු කළැයි පැවසෙන සහකාර පොලිස් අධිකාරීවරුන් දෙදෙනෙකුට එරෙහිව විනය පියවර ගැනීමට අවධානය යොමු වී ඇත.

3) මව්බිම සිරස්තලය: "අංක තහඩු නැති යතුරුපැදි 4ක් නිසා මැතිසබය ඉදිරිපිට කලබලයක්"

- මුහුණු ආවරණය කරගෙන, යුද හමුදාවට සමාන කළු ඇඳුමින් සැරසී නාඳුනන සන්නද්ධ යතුරුපැදි කණ්ඩායමක් පාර්ලිමේන්තුව ඉදිරිපිට පැමිණ ඇත.

- එම යතුරුපැදි වල අංක තහඩු තිබී නොමැත.

- විරෝධතාකරුවන් නොතකා, ඔවුන් හා ගැටෙමින් මොවුන් අනතුරුදායක හා අපරීක්ෂාරී ලෙස ඉදිරියට යතුරුපැදි ධාවනය කොට ඇත.

- ප්‍රදේශයේ ආරක්ෂාවට සිටි පොලිස් නිලධාරීන් එම යතුරුපැදි දෙකක් නවත්වා, ඉන් එකක සිටි පුද්ගලයින්ගෙන් ප්‍රශ්න කර ඇත.

- එම යතුරුපැදි වල අංක තහඩු තිබුණාද නැද්ද යන්න විධිමත්ව සොයාබැලිය යුතු බව

පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පැවසීය.

ඔබේ අදහස?